www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ යුද්ධය පිලිබඳව අධිරාජ්‍යවාදීන්ගේ කුහකත්වය

**Imperialist hypocrisy over the Sri Lankan war**

2009 අප්‍රේල් 30

**හ**මුදාව හා එල්ටීටීඊ අතර උතුරේ කෙරීගෙන යන සටනට මැදිවී සිටින 50,000 පමන යයි සැලකෙන සිවිල් වැසියන්ගේ ඉරනම ප්‍රධාන කොට ගත් උතුරු ශ්‍රී ලංකාවේ දිගහැරෙමින් ඇති මානව ඛේදවාචකය, ප්‍රධාන ලෝක බලවතුන්ගේ පැත්තෙන් ගත් කල කුහක භාවයේ කනස්සල්ල පලකෙරෙන අවස්ථාවක් බවට පත්ව තිබේ.

පසුගිය සතිය පුරා එක්සත් ජනපදය, යුරෝපා සංගමය හා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය සිය නියෝජිතයන් එනම්, එජා මානව කටයුතු ප්‍රධානී ජෝන් හෝම්ස්, බ්‍රිතාන්‍ය විදේශ ලේකම් ඩේවිඩ් මිලිබෑන්ඩ් හා ප්‍රන්ස විදේශ ඇමති බර්නාඩ් කුෂ්නර් කොලඹට පිටත්කර හරිමින් සටන් විරාමයකට එකගවන ලෙස ආන්ඩුවට කැඳවුම් කලේය.

තාවකාලික සටන් අත්හිටුවීමක් හා එජා මානව ආධාර කන්ඩායමකට යුද කලාපයට පිවිසීමට ඉඩ දෙන ලෙස කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කල ජනාධිපති මහින්ද රාජපක්ෂ, දැන් කුඩා බිම් කඩක කොටුවී සිටින එල්ටීටීඊය කොන්දේසි විරහිතව යටත්විය යුතු බව හෝ මුලිනුපුටා දැමිය යුතු බව අවධාරනය කරයි. මෙම සතිය තුල බර අවි යොදා නොගන්නා බවට ආන්ඩුව දුන් සහතිකය පවා එය නිකුත් කර පැය ගනනක් යාමටත් පෙර ම කඩාදමන ලදී. එහි ප්‍රතිපලය වශයෙන් මිනිසුන් ගැහැනුන් හා ලමුන් සිය ගනනක් පසුගිය සතිය තුල මිය ගියේය.

යුද්ධය නතර කිරීම සඳහා අධිරාජ්‍යවාදී බලවතුන්ගේ මැදිහත්වීම කෙරෙහි කිසිවෙකුත් විශ්වාසය තැබිය යුතු නොවේ. පසුගිය සතියේ නිකුත් කල එජා ආරක්ෂක මන්ඩල සභාපතිගේ ප්‍රකාශයෙන් ඔවුන්ගේ ආකල්පය මොනවට පැහැදිලිය. රාජපක්ෂ ආන්ඩුවේ යුද අපරාධ පිලිබඳව එය හෙලාදැකීමක් හෝ සටන් නතර කිරීමට අසමත් වුවහොත් එයට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නා බවට තර්ජනය කිරීමක් කෙසේ වෙතත්, ප්‍රකාශයෙන් අවධාරනය කර තිබුනේ එල්ටීටීඊය අවි බිම තබා යටත් විය යුතු බවයි.

2006 දී රාජපක්ෂ යුද්ධය යලි අරඹන තෙක් පැවති සාම ක්‍රියාදාමයේ ඊනියා ජාත්‍යන්තර සම සභාපතිවරුන් වූ එක්සත් ජනපදය (එජ), යුරෝපා සංගමය, ජපානය හා නෝර්වේහි ආස්ථානය සමඟ ප්‍රකාශය මනාව ගැලපුනි.

හමුදාවේ බරපතල අපරාධ පිලිබඳව ඉඳහිට විරෝධය දක්වන අතර 2002 සටන් විරාමය උල්ලංඝනය කරමින් ආන්ඩුව යලි යලිත් ආක්‍රමන දියත් කරද්දී සම සභාපතිවරු ඔහේ බලා සිටියහ. එජ අඛන්ඩව හමුදා පුහුනුව හා ආධාර සැපයූ අතර ඊස්රායලය හා පකිස්ථානය යන එහි සගයන්ට ආයුධ සැපයීමට අවසර ලබා දුන්නේය.

රාජපක්ෂ සිය ආක්‍රමනයේදී අනුගමනය කර ඇත්තේ වොෂින්ටනයේ ම ප්‍රෝඩාකාරී " ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" රටාවය. එල්ටීටීඊ ත්‍රස්තවාදීන් ලෙස හෙලා දකිමින් ද සිවිල් වැසියන්ගේ මරනවල දී එල්ටීටීඊය ඔවුන් "මිනිස් පලිහක්" ලෙස

යොදාගන්නේය යන කාරනය මත තබා එයට චෝදනා කරමින් ද අත්තනෝමතික රඳවා තැබීම්, වධ බන්ධන හා ඝාතන ද ඔහු පිහිට කොට ගත්තේය. එල්ටීටීඊය තම " ත්‍රස්තවාදී ලැයිස්තුවෙහි" තබාගනිමින් ද එයම අනුගමනය කිරීමට යුරෝ සංගමයට හා කැනඩාවට බලකරමින් ද එක්සත් ජනපදය, රාජපක්ෂ ආන්ඩුවට දේශපාලන හා රාජ්‍ය තාන්ත්‍රික පිටුබලය ලබා දුන්නේය.

යථාර්තය නම් 26 වසරක ගැටුම " ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක්" නොව, බලයට පත් සෑම ආන්ඩුවක්ම තම පැත්තෙන් දශක ගනනාවක් ගෙන ගිය දෙමල විරෝධී වෙනස්කම් කිරීමෙන් නිර්මානය වූ වාර්ගික යුද්ධයකි යන්නය. එහි අරමුන වූයේ දෙමල සුලුතරයේ පමනක් නොව සමස්තයක් ලෙස කම්කරු පන්තියේ ම වියදමෙන් සිංහල පාලක පැලැන්තියේ බලය හා වරප්‍රසාද සුරක්ෂිත කර ගැනීමයි.

පසුගිය සැප්තැම්බරයේ හමුදාපති සරත් ෆොන්සේකා "මේ රට අයිති සිංහලයන්ට බව මම තරයේ විශ්වාස කරමි" යනුවෙන් ප්‍රකාශ කරමින් මෙම සිංහල අධිපතිවාදී ආකල්පය විදහා දැක්වීය. "ඔවුන්ට (සුලු ජාතීන්ට) මේ රට තුල අප සමග එකට ජීවත්විය හැකිය. එහෙත් ඔවුන් සුලු ජාතියක්ය යන්න නිමිත්ත කොට ගෙන අනවශ්‍ය දේ නොඉල්ලිය යුතුය."

කොලඹ පවතින විෂසෝර වර්ගවාදී වාතාවරනය තුල සටන් විරාමයක් සඳහා කෙරෙන කුමන හෝ ඉල්ලීමක් හඳුන්වනු ලබන්නේ "කොටි ත්‍රස්තවාදීන් ගලවා ගැනීමේ" උත්සාහයක් ලෙස ය. ශ්‍රී ලංකා සංස්ථාපිතය ජාත්‍යන්තරව පලවන කනස්සල්ල පිලිබඳ ප්‍රකාශනයන් කෙරෙහි දක්වන්නේ යාන්තමින් සැඟවීගත් පසමිතුරු කමකි. නිදසුනක් ලෙස පසුගිය සතියේ දක්ෂිනාංශික අයිලන්ඩ් පත්‍රයේ පලවූ කතුවැකියකින් දෙමල වැසියන්ගේ දුක් ගැහැට බැහැර කරමින් අසා තිබුනේ "යුද්ධය දුක් පීඩා සමග බැඳී ඇති බව නොදන්නේ කවුරුන් ද?" යනුවෙනි.

ප්‍රධාන බලවතුන්ගේ "මානවවාදී" උත්සුකයන් පිටුපස ඇත්තේ නිශ්චිත ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන් ය. ඔබාමා පාලනාධිකාරය ශ්‍රී ලංකා මිලිටරිය විසින් දෙමල වැසියන් මරාදැමීම ගැන, එක්සත් ජනපද බෝම්බ හා රොකට් මඟින් ඇෆ්ගනිස්ථාන හා පකිස්ථාන වැසියන් ඝාතනය කිරීම පිලිබඳව දක්වනවාට වඩා වැඩි සැලකිල්ලක් නොදක්වයි. එජ, බ්‍රිතාන්‍යය හා ප්‍රන්සය මෙන්ම චීනය හා ඉන්දියාව ද අනෙකුත් සුලු බලවතුන් ද එල්ටීටීඊ පරාජය හමුවේ නිර්මානය වී ඇති නව වාතාවරනය තුල තම තමන්ගේ ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකාව වටා කරක් ගසමින් සිටිති.

වොෂින්ටනය දේශපාලන විසඳුමක් සඳහා බලපෑම් කරන්නේ එල්ටීටීඊය බේරාගැනීම සඳහා නොව, දිවයිනේ සිංහල හා දෙමල ප්‍රභූ පැලැන්තිය අතර එකගතාවක් ඇතිකර නොගතහොත් දැනටමත් පැසවමින් ඇති අස්ථාවරත්වය වාර්ගික ආතතීන් නිසා ඔඩු දුවනු ඇතැයි යන බිය නිසාය. උතුරේ දෙමල වැසියන් ඝාතනය කිරීම පිලිබඳව දැනටමත් පුලුල් ලෙස කෝපය පැතිර ඇති දකුනු ඉන්දියානු දෙමල වැසියන් අතරට ශ්‍රී ලංකාවේ නොසංසුන්තාවය උතුරා යාමේ තර්ජනය ද මතුව තිබේ. පසුගිය දශකය පුරා වොෂිංටනය නව දිල්ලිය සමග සමීප ආර්ථික හා මූලෝපායික සබඳතා ගොඩනගාගෙන තිබේ.

ශ්‍රී ලංකාව තුල සිය අවශ්‍යතා පෙරට දමා ගැනීමේ ඕනෑකම ද එක්සත් ජනපදයට ඇත. පසුගිය සතියේ වොෂිංටනයේ පැවති ව්‍යාපාරික හමුවක දී එජ සහකාර වෙලඳ නියෝජිත මයිකල් ඩිලානි යුද්ධය අවසන් වූ විට එලඹෙන නව ආයෝජන අවස්ථා ගැන කථාකල අතර මෙම වසර අවසානයේ ඇමරිකානු ව්‍යවසායකයන් එහි සංචාරය කරනු ඇතැයි ද නිවේදනය කලේය.

අත්පත්කර ගැනීමේ හා සේවා හුවමාරු සම්මුතිය යටතේ පෙන්ටගනයට දැනටමත් ශ්‍රී ලංකාවට ප්‍රවිෂ්ටයක් ලැබී ඇති අතර වඩා සමීප සබඳතා අපේක්ෂාවෙන් සිටියි. මෑත වසරවල ඉහල පෙලේ එක්සත් ජනපද මිලිටරි කන්ඩායම් ශ්‍රී ලංකාවේ සිය සහකරුවන්ට උපදෙස් සම්පාදනය කර ඇතුවා පමනක් නොව, කලාපයේ ප්‍රධාන ගැඹුරු වරායක් ලෙස සැලකෙන ත්‍රිකුනාමල වරායට ද ගොස් ඇත.

මැද පෙරදිග හා අප්‍රිකාවේ සිට ආසියාව දක්වා වැටී ඇති ප්‍රධාන නාවික මාර්ග පසෙකින් ඉන්දීය සාගරය තුල දිවයිනේ මූලෝපායික පිහිටීම, ජාත්‍යන්තර එදිරිවාදීන්ගේ අවධානය ඒ වෙත යොමු කරවා තිබේ. රාජපක්ෂගේ යුද්ධයට කොන්දේසි විරහිතව පිටුබලය දෙන හා මූල්‍යාධාර මෙන්ම ආයුධ ද සම්පාදනය කරන චීනයේ වැඩෙන බලපෑමට වැට බැඳීමට, එක්සත් ජනපදය උනන්දුවක් දක්වයි. චීනයට ප්‍රති උපකාර වශයෙන් කොලඹ ආන්ඩුව, එහි වෙලඳ මාර්ගවල ආරක්ෂාව සඳහා වූ චීන නාවික මූලෝපායේ කොටසක් ලෙස, දකුනේ හම්බන්තොට ප්‍රධාන වරායක් ඉදිකිරීමට චීනයට ඉඩ කඩ සලසා දී තිබේ. ශ්‍රී ලංකාව සිය කලාපීය බලපෑම් වැයික්කියේ කොටසක් ලෙස සලකන ඉන්දියාව ද, චීනයේ හා පකිස්ථානයේ කටයුතුවලට යටින් කැපීමේ උත්සාහයක නිරතව සිටියි.

මෙම ප්‍රයෝගකාරී ශට කපටකම් හා කුමන්ත්‍රන, යුද්ධය නතරකිරීම සඳහා "ජාත්‍යන්තර ප්‍රජාව" ඇමතීමේ එල්ටීටීඊ ප්‍රයත්නයේ නිරර්ථක භාවය පෙන්නුම් කරයි. එල්ටීටීඊය පැමින සිටින මලාන්තය, දිවයිනේ උතුරු හා නැගෙනහිර වෙනම ධනේශ්වර ඊලම් රාජ්‍යයක් සඳහා පිටුබලය සපයන ලෙස ඒ හෝ මේ ප්‍රධාන බලවතෙකුට ආයාචනය කිරීම මත පදනම් වූ එහි දේශපාලන ඉදිරිදර්ශනයේ ප්‍රතිපලයයි. වාර්ගික බෙදීම් ගැඹුරු කිරීමට පමනක් උපකාරී වී ඇති මෙම බෙදුම්වාදී ක්‍රියාමාර්ගය නියෝජනය කරන්නේ දෙමල ධනේශ්වරයේ මිස දෙමල ජනතාවගේ අවශ්‍යතාවන් නොවේ.

ප්‍රගතිශීලී පදනමක් මත කම්කරු පන්තියට යුද්ධයට අවසන් තිත තැබිය හැක්කේ තමන්ගේ ම ස්වාධීන ඉදිරිදර්ශනය මත පිහිටාගනිමින් පමනි. සමාජවාදී ප්‍රතිපත්ති මත පදනම් වූ කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් සඳහා අරගලයට කම්කරු පන්තිය එක්සත් කිරීමේ පලමු පියවර ලෙස උතුරෙන් හා නැගෙනහිරෙන් වහාම හා කොන්දේසි විරහිතව ශ්‍රී ලංකා හමුදාව ඉවත් කිරීම සඳහා සටනට සමාජවාදී සමානතා පක්ෂය විසින් සියලු කම්කරුවන්ට කැඳවුම් කරයි.

සිංහල මෙන්ම දෙමල කම්කරුවන්ගේ සහකරුවන් වන්නේ අධිරාජ්‍යවාදී බලවතුන් නොව කලාපයේ ද ජාත්‍යන්තරව ද පැතිර සිටින වැඩ කරන ජනතාවයි. ශ්‍රී ලංකා හා ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා සටන, දකුනු ආසියාවේ හා ලොව පුරා සමාජවාදී රාජ්‍යයන්ගේ සංගමයක් සඳහා අරගලයේ කොටසක් විය යුතු යයි සමාජවාදී සමානතා පක්ෂය අවධාරනය කරන්නේ එබැවින් ය.

පීටර් සිමන්ඩ්ස්

© www.wsws.org

.

.

.

.

.